# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බෞද්ධ සංස්කෘතිය

### 03 වන පාඩම; ගිහි ජීවිතයේ සිරිත් විරිත්

[[ 2024/2025 ]] 03 වන ප්‍රශ්නය

I පංශුකූල චාරිත්‍රයේ ඇති ආගමික,සාමාජීක හා මනෝ විද්‍යාත්මක වටිනාකම පැහැදිලි කරන්න.

[[ 2019/2020 ]] 01 වන ප්‍රශ්නය

I අකුසල් හා පව්වලට හේතුවන කරුණු නම් කොට,ඒවායේ ආවේණික ලක්ෂණ හඳුන්වන්න.
II ඉහත දැක්වෙන අකුසල් හා පව් යටපත් කළ හැකි ආකාරය විස්තර කරන්න.
III ‘දානය’ හඳුන්වා ‘අභය දානය’ යන්න පැහැදිලි කරන්න.

[[ 2017/2018 ]] 02 වන ප්‍රශ්නය

I බෞද්ධ ගිහියා විසින් පවා සංයමයෙන් යුතුව ආහාර අනුභව කළ යුතු ආකාරය බෞද්ධ ඉගැන්වීම් ආශ්‍රයෙන් විභාග කරන්න.

[[ 2009/2010 ]] 03 වන ප්‍රශ්නය

I දරුවන් විසින් මවුපියන් කෙරෙහි පිළිපැදිය යුතු කරුණු පහ නම් කරන්න.
II සිඟාලෝවාද සූත්‍රගත ධනය සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලිය කී වැදෑරුම්ද ඒවා නම් කරන්න.
III සාර්ථක ගිහි ජීවිතයක් ගත කිරීම සඳහා සිඟාලෝවාද සූත්‍රයේ ඇතුළත් කරුණුවල ඇති වැදගත්කම පිළිබඳ ඇගයීමක් කර්න්න.

[[ 2008/2009 ]] 03 වන ප්‍රශ්නය

I ධනංජය සිටුතුමා පතිකුලයට යන සිය දියණියට දුන් අවවාද පහක් නම් කරන්න.
II සිඟාලෝවාද සූත්‍රයෙහි සඳහන් පරිදි ගෘහපතියෙකු සේවනය නොකළ යුතු කරුණු නම් කරන්න.
III සාර්ථක විවහා ජීවිතයකට සිඟාලෝවාද සූත්‍රයේ ඇතුළත් කරුණු කෙතෙක් දුරට ඉවහල් වේදැයි විමසන්න.

සිල්මෙත් සෙවණ දහම් පාසල් පෙළෙද්දේ

## [[ 2006/2007 ]] 03 වන ප්‍රශ්නය

I උපතේ සිට විවාහය තෙක් බෞද්ධයෙකු අනුගමනය කරන සිරිත් විරිත් ගෙනහැර දක්වන්න.

II සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන දරුවන්ගේ යහපත සඳහා දෙමව්පියන් ඉටුකළ යුතු කාර්‍ය භාරය කෙටියෙන් දක්වන්න.

III "ධනය ඉපයීම මෙන්ම ධනය වැය කිරීමද බුද්ධිමත්ව සිදුවිය යුතුය." ඒ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

## [[[ 2005 ]]] 03 වන ප්‍රශ්නය

I බෞද්ධ ගෘහස්ත ජීවිතය ආශ්‍රිතව පවත්නා ස්වාමි-භාර්යා සම්බන්ධයේ සාර්ථකත්වයට හේතුවන කරුණු ගැන හැඳින්වීමක් කරන්න.

## [[[ 2003 ]] 03 වන ප්‍රශ්නය

I බුදුරජාණන් වහන්සේ වස්තු විනාශයට හේතුවන කරුණු ලෙස පෙන්වා දී ඇත්තේ මොනවාදැයි ලියන්න.

II බෞද්ධ සාහිත්‍යයේ දැක්වෙන පරිදි භාර්යාවෝ සත් දෙනෙක් වෙති.ඉන් තිදෙනෙක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.

III "පවුල් සංස්ථාව ඉදිරියටත් පවත්වාගෙන යාමට නම් අඹුසැමියන් අතර සුහදත්වයත්,විශ්වාසයත් වර්ධනය වියයුතුය." සාකච්ඡා කරන්න.

## [[[ 2002 ]] 02 වන ප්‍රශ්නය

I බුද්ධ කාලීන සමාජයෙහි පැවති ධාර්මික රැකියා තුනක් හඳුන්වන්න.

II වප් මඟුල් උත්සවය ගැන විස්තරයක් ඉදිරිපත් කරන්න.

III කුඹුරු ගොවිතැන හා සම්බන්ධ පැරණි සිරිත් පිළිපැදීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන දක්වන්න.

## [[[ 1999 ]]] 03 වන ප්‍රශ්නය

I දරුවන් විසින් දෙමාපියන් වෙත ඉටු කළ යුතු චාරිත්‍ර පහෙන් තුනක් ලියන්න.

II මව්පිය උපස්ථානය නොකරන්නා ගැන වසල සූත්‍රයෙහි සඳහන් ගාථාව හෝ එහි අදහස ලියන්න.

III මව්පිය උපස්ථානයෙන් සිදුවන යහපත ගැන විස්තරයක් කරන්න.

## [[[ 1998 ]]] 03 වන ප්‍රශ්නය

I දෙමව්පියන් දරුවන් හදාවඩා ගන්නා සතර බ්‍රහ්ම විහරණ දක්වන්න.
II ඒවායින් එකක් ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
III දෙමව්පිය දූදරු සම්බන්ධතාව මැනවින් පවත්වාගෙන යාමට සතර බ්‍රහ්ම විහරණ උපකාරවන ආකාරය විස්තර කරන්න.

විල්වල ස්වෝමීන්ගේ හාමුදුරුවෝ